ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

මගේ අංකය } USJ/FHSS/02
My Number

ඔබේ අංකය }
Your Number

නුගේගොඩ
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.

තැපැල්පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.

2024-01-17

Ven. Sir, Student,

**<u>Commencement of the Academic Year and Orientation Programme 2022/2023</u>**

First of all, I would like to congratulate you on being selected as an undergraduate of the Faculty of Humanities & Social Sciences of the University of Sri Jayewardenepura on successful completion of G.C.E. (A/L) examination.

The first phase of the orientation programme will be conducted online, on the $19^{th}$ & $20^{th}$ January 2024 at 8.00 a.m. You will be able to access further details regarding the programme and the necessary procedure to enroll in your academics from the faculty of Humanities and Social Sciences website (fhss.sjp.ac.lk/orientation/). Moreover, from the above website you will be able to access the soft copy of the faculty undergraduate prospectus which contains all the information of the degree programmes and other essential requirements that must be followed by the faculty. It is very necessary that you read it carefully as it will be very convenient when selecting course units and for your future academic purposes.

The second phase of the orientation programme will happen from the $22^{nd}$ to $27^{th}$ January 2024.The inaugural session will be held on the $22^{nd}$ January 2024 at the Bandaranayake Hall, with the presence of the Vice Chancellor, Dean and the academic staff giving you a warm welcome you. Physical lectures will be scheduled to commence on $29^{th}$ January 2024.

I wish you all the success to pave a fruitful path in your university life!

Prof. Shirantha Heenkenda
Dean
Faculty of Humanities & Social Sciences
University of Sri Jayewardenepura
Nugegoda, Sri Lanka.

Professor Shirantha Heenkenda
Dean
Faculty of Humanities and Social Sciences

Telephone / දුරකථන } 2802695,2802696,2803191 2803192,2801024,2801025
Fax / ෆැක්ස් } 2801604
E.Mail / ඊ මේල් } unisj@sjp ac.lk

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


මගේ අංකය } USJ/FHSS/02
My Number

ඔබේ අංකය }
Your Number

නුගේගොඩ
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.

තැපැල්පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.


2024-01-17

ගරු ස්වාමීන් වහන්ස/ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

<u>2022/2023 අධ්‍යයන වර්ෂය ආරම්භය සහ නම්නීකරණ වැඩසටහන</u>

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වූ ඔබ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයකු/අපේක්ෂිකාවක ලෙස තේරී පත්වීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත් වෙමි. ඒ වෙනුවෙන් මාගේ සුභාශිංසන පළමුව පිරිනමමි.

විශ්වවිද්‍යාලය හා පීඨය පිළිබඳව නවක ඔබගේ දැනුම්වත්වීම සඳහා පවත්වනු ලබන නම්නීකරණ වැඩසටහනෙහි පළමු අදියර 2024 ජනවාරි 19 සහ 20 යන දෙදින පෙරවරු 8.00 සිට අන්තර්ජාලය හරහා මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ ආරම්භ වීමට නියමිතය. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු අප විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ වෙබ් අඩවියට (fhss.sjp.ac.lk/orientation/) පිවිසීමෙන් ලබාගත හැකි අතර ඉදිරි අධ්‍යයන කටයුතුවලට ඔබ සහභාගී විය යුතු ආකාරය ඇතුළු සියලු විස්තර එම වෙබ් අඩවිය හරහා ඔබට දැනගත හැකිවනු ඇත. එසේම මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් පවත්වනු ලබන සියලු උපාධි පාඨමාලා පිළිබඳ තොරතුරු ඇතුළත් පීඨ ශිෂ්‍ය විවරණිකාවේ මෘදු පිටපත ද ඉහත වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි අතර අධ්‍යයන කටයුතු ආරම්භවීමට පූර්වයෙන් එය හොඳින් කියවා අවබෝධ කර ගෙන සිටීම, විෂයයන් තෝරා ගැනීමේ දී සහ ඉදිරි අධ්‍යයන කටයුතුවලදී ඔබට මහඟු පිටුබලයක් සපයනු ඇත.

විශ්වවිද්‍යාලය වෙත නවක ඔබ පිළිගැනීම සහ පීඨයේ උපාධි පාඨමාලා හඳුන්වාදීම ඇතුළු වැඩසටහන් ගණනාවක් සහිත නම්නීකරණ වැඩසටහනේ දෙවැනි අදියර 2024 ජනවාරි 22 වන දින ප.ව. 1.00ට විශ්වවිද්‍යාලයීය බණ්ඩාරනායක දේශන ශාලාවේදී ආරම්භ කිරීමට නියමිත අතර 2022 ජනවාරි 27 වැනිදා තෙක් පවත්වන එම වැඩසටහනෙන් අනතුරුව ඔබගේ අධ්‍යයන කටයුතු ඇරඹීමට නියමිතය.

ඒ අනුව නව මානයන් ඔස්සේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන ඔබ සැමට සුබ පැතුම් එක් කරන අතර සියලු අනාගත අභිලාෂයන් සඵල කර ගැනීමට අවැසි මංපෙත් එමගින් විවර වේවා'යි මම ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද,
පීඨාධිපති,
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය.


Telephone / දුරකථන } 2802695,2802696,2803191 2803192,2801024,2801025
Fax / ෆැක්ස් } 2801604
E.Mail / ඊ මේල් } unisj@sjp ac.lk